ඉතාලිය]

# පිළිගැනීම තුළ ඔබේ අයිතීන් සහ වගකීම්



**මෙම තොරතුරු ඔබ සඳහායි:**

- ඔබ වැඩිහිටියෙක් (වයස අවුරුදු 18 ට වැඩි) නම්
- ඉතාලියහි ජාත්‍යන්තර ආරක්ෂාව ( රැකවරණය ලෙසද හැඳින්වේ) සඳහා ඉල්ලුම් කර ඇත්නම් සහ ඔබ දැන් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු නම්

ලියාපදිංචිය සඳහා වන අනුවාදය

SINHALESE

# පටුන


පිළිගැනීම යනු කුමක්ද? 3

ඔබට සහ ලැබෙන්නේ මොනවාද? 6

සෞඛ්‍ය සේවා සඳහා අයිතිය 7

දරුවන්ට අධ්‍යාපනයට ඇති අයිතිය 10

රැකියාවක නිරත වීමට ඇති අයිතිය 11

භාෂා පාඨමාලා සහ වෘත්තීය පුහුණුව 12

ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු බව සඳහන් කරන ලේඛනය 13

ඔබ නැවතී සිටින්නේ කොහේද? 13

අයදුම්කරුවෙකු රඳවා තබා ගත හැකි අවස්ථා -

ඔබට පිළිගැනීම තුළ ඇති වගකීම් මොනවාද? -

ඔබ ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද? -

බලධාරීන්ගේ අවසරයකින් තොරව ඔබ වෙනත් EU+ රටකට ගමන් කළහොත් කුමක් සිදුවේද? -

ඔබ අවසරයකින් තොරව හැර ගිය EU+ රට වෙත ආපසු යැවූ පසු කුමක් සිදුවේද? -

ඔබට අධිකාරියේ තීරණයකට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය -

ඔබට නීතිමය සහාය ලැබිය හැකිය -


සම්බන්ධතා තොරතුරු -

## පිළිගැනීම යනු කුමක්ද?

බලධාරීන් ඔබේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පත පරීක්ෂා කරන තෙක් ඔබ රැඳී සිටින අතරතුර අයදුම්කරුවෙකු ලෙස ඔබට ලැබෙන සහාය පිළිගැනීම වේ. මෙම විස්තර පත්‍රිකාවේ පැහැදිලි කර ඇති පිළිගැනීමේ අයිතීන් සහ වගකීම් එයට ඇතුළත් වේ.

ඉතාලියේදී, ඔබගේ දේශපාලන රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වන නිසි බලධාරියා වන්නේ—අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ සිවිල් නිදහස සහ ආගමන කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය රජයේ කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන—පිළිගැනීමේ කටයුතු භාර අධිකාරියයි.

මෙම විස්තර පත්‍රිකාවේ ඇති තොරතුරු ඔබට ලැබුණු බව තහවුරු කර අත්සන් කරන ලෙස කාර්ය මණ්ඩලය ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. යමක් පැහැදිලි නැත්නම් හි කාර්ය මණ්ඩලයෙන් ප්‍රශ්න අසන්න.



**ඔබ මෙම රට තුළ ආරක්ෂිතයි.**

ඔබ නැවතී සිටින කාලය තුළ, *සාමාජික රටට අදාළ කාර්ය මණ්ඩලය* ඔබේ තත්ත්වය අනුව ඔබට ලබා ගත හැකි පිළිගැනීමේ සේවාවන් සහ සහාය පිළිබඳව ඔබට දැනුම් දෙනු ඇත.



ඔබට වෙනත් සංවිධානවලින් තොරතුරු සහ උපකාර නොමිලේ ඉල්ලා සිටිය හැකිය. මෙම විස්තර පත්‍රිකාව අවසානයේ ඔබට සංවිධාන ලැයිස්තුවක් සොයාගත හැකිය.



අවශ්‍ය විටෙක, ඔබට වැටහෙන භාෂාවකින් කාර්ය මණ්ඩලය සමඟ සන්නිවේදනය කිරීමට **භාෂණ පරිවර්තකයෙකු** ඔබට සහාය වනු ඇත. පරිවර්තකයා ඔබ පවසන කිසිවක් වෙනත් කිසිවෙකු සමඟ බෙදා නොගනු ඇත.

මෙම තොරතුරු වෙනත් නිසි බලධාරීන් සමඟ ද හුවමාරු කර ගත හැකිය.

**රැකවරණ ක්‍රියාපටිපාටිය සහ අනුගමනය කළ යුතු නීති පිළිබඳ ව තොරතුරු ඔබට වෙන් වෙන් විස්තර පත්‍රිකාවලින් සොයාගත හැකි වනු ඇත.**

**ඔබ දැන් ඉතාලියේ හි සිටින අතර, එය EU රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

## අවධානය පිණිසයි!

සියලුම EU+ රටවල අයදුම්කරුවන්ට සමාන පිළිගැනීමේ අයිතීන් සහ වගකීම් ඇත.

රැකවරණය සඳහා අයදුම් කිරීම සහ අනෙකුත් EU+ රටවලට ගමන් කිරීම සම්බන්ධව නීති පවතී.


බලධාරීන් ඔබට වෙනත් ආකාරයකින් දැනුම් දුන්නේ නම් මිස, **ඔබ මුලින් ම පැමිණි EU+ රටෙහි රැකවරණය සඳහා අයදුම් කර ඔබේ අයදුම්පත ලියාපදිංචි කළ යුතුය.**

**ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ එක් EU+ රටක් පමණි. ඉතාලියේ**බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත සඳහා වගකිව යුතු EU රට තීරණය කිරීමට ක්‍රියාපටිපාටියක් අනුගමනය කරනු ඇත.

**ඔබ ඉතාලියතුළ රැඳී සිටිය යුතුය. බලධාරීන්ගේ අවසරයකින් තොරව ඔබට වෙනත් EU+ රටකට ගමන් කළ ඉතාලිය**තුළ ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නතර විය හැකිය. අනෙක් රට තුළ ඔබේ ගමන් කිරීමේ නිදහස සීමා විය හැකි අතර ඇතැම් පිළිගැනීමේ සේවා අවලංගු කෙරෙනු ඇත.

## ඔබට ලැබෙන්නේ මොනවාද?

බලධාරීන් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබේ අයදුම්පත පරීක්ෂා කරන අතර, ඔබේ පුද්ගලික සහ මූල්‍ය තත්ත්වය මත පදනම් ව, ඔබට පහත දේ ලැබෙනු ඇත:



- නවාතැන්



- පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන



- ආහාර



- ඇඳුම් පැළඳුම්



- දෛනික වියදම් සඳහා මුදල්

ඔබේ පුද්ගලික සහ මූල්‍ය තත්ත්වය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා බලධාරීන් ඔබෙන් ප්‍රශ්න අසනු ඇත.

## සෞඛ්‍ය සේවා සඳහා අයිතිය

ඔබට **අවශ්‍ය සෞඛ්‍ය සේවාව** ඔබට ලැබෙන බවට බලධාරීන් සහතික වනු ඇත. මෙයට උදාහරණයක් ලෙස හෙදියක හෝ වෛද්‍යවරයෙකු හමුවීම, දරුණු රෝග සහ නිදන්ගත තත්වයන් සඳහා පරීක්ෂාව, වෛද්‍යවරයෙකු විසින් නියම කරන ලද ඖෂධ සහ මානසික සෞඛ්‍ය සහාය ඇතුළත් විය හැකිය.



**ඔබට වෛද්‍ය ගැටළුවක් තිබේ නම්, කාර්ය මණ්ඩලයට පවසන්න.**

ඔබට හදිසි වෛද්‍ය ආධාර හෝ හදිසි ප්‍රතිකාර අවශ්‍ය තුවාලයක් ඇත්නම්, කාර්ය මණ්ඩලයට පවසන්න හෝ හදිසි අවස්ථා අංකය වන 112 ට නොමිලේ අමතන්න.



ඔබට හෙදියක හෝ වෛද්‍යවරයෙකු සමඟ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී වීමට සිදුවිය හැකිය. ඔවුන් ඔබේ සෞඛ්‍යය පිළිබඳව පරීක්ෂා කර ඔබට සහාය වනු ඇත. ඔවුන් ඔබෙන් වර්තමාන හෝ අතීත රෝග, ඔබේ එන්නත් වාර්තා සහ ඔබ ගන්නා ඕනෑම ඖෂධයක් පිළිබඳව ප්‍රශ්න ඇසිය හැකිය. ඔබට ඇති විය හැකි ඕනෑම තුවාලයක්, වේදනාවක්, තත්ත්වයක් හෝ කරදර පිළිබඳව ද ඔවුන් ඔබෙන් ඇසිය හැකිය.

**ඔබට විශේෂ අවශ්‍යතා තිබේ නම්, විශේෂිත සහාය ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.**







කාර්ය මණ්ඩලයට දන්වන්න:

- ඔබ අසනීප හෝ තුවාල ලබා සිටී නම්
- ඔබ ගැබ්ගෙන සිටී නම්  ගැබ්ගෙන සිටිය හැකි නම්
- ඔබට විශේෂිත සහාය අවශ්‍ය පවුලේ සාමාජිකයන් සිටී නම්
- ඔබට ආබාධ තිබේ නම් (උදාහරණයක් ලෙස, සීමිත සංචලනය, ශ්‍රවණාබාධ, දෘශ්‍යාබාධිත වීම)
- ඔබට නිරන්තරයෙන් දුකක්, කනස්සල්ලක් දැනෙනවා නම්, ඔබට නිදාගත නොහැකි නම් හෝ ඔබට ඍණාත්මක සිතුවිලි තිබේ නම්
- ඔබ අතීත ප්‍රචණ්ඩත්වයෙන් හෝ වධහිංසාවලින් පීඩා විඳිනවා නම්
- ඔබට අනාරක්ෂිත බවක්, තර්ජනාත්මක බවක් දැනේ නම් හෝ යමෙකුට, ආගන්තුකයෙකුට හෝ ඔබ දන්නා පුද්ගලයෙකුට පවා බිය නම්
- ඔබට කිරීමට අවශ්‍ය නැති දේවල් කිරීමට ඔබට බල කර තිබේ නම් හෝ බල කරන්නේ නම්
- ඔබේ ඇදහිල්ල, ඔබ ආදරය කරන අය, ඔබ අඳින පළඳින ආකාරය හෝ හැසිරෙන ආකාරය නිසා ඔබට අනාරක්ෂිත බවක් දැනේ නම්.
- ඔබ වයස අවුරුදු 18 ට අඩු නම් සහ ඔබ පැමිණීයේ ඔබේ දෙමාපියන් නොමැතිව, තනිවම හෝ පවුලේ අනෙකුත් සාමාජිකයන් සමඟ නම්

විශේෂිත සහාය ලබා දිය හැක්කේ *සාමාජික රටට අදාළ කාර්ය මණ්ඩලය* හි කාර්ය මණ්ඩලය ඔබේ විශේෂ අවශ්‍යතා පිළිබඳව දන්නා විට පමණි.



- ඔබේ විශේෂ අවශ්‍යතා විනිශ්චය කිරීමට
- ඔබට වඩාත්ම සුදුසු කුමන විශේෂිත සහාය ද යන්න හඳුනා ගැනීමට

විශේෂිත කාර්ය මණ්ඩලය ඔබෙන් ප්‍රශ්න අසනු ඇත].

මෙය විශේෂ අවශ්‍යතා පිළිබඳ ව අවදානම් තක්සේරුවක් ලෙස හැඳින්වේ.



අවශ්‍ය නම්, ඔබට වැටහෙන භාෂාවකින් සන්නිවේදනය කිරීමට පරිවර්තකයෙකු ඔබට උපකාර කරනු ඇත.

ඔබව විශේෂිත ආධාරක සේවාවන් වෙත යොමු කළ හැකිය.



ඔබට විශේෂිත සහාය අවශ්‍ය නම්, **සෑම විටම හි කාර්ය මණ්ඩලය සම්බන්ධ කරගන්න.**

බලධාරීන් ඔබට අවශ්‍යතාවයක් ඇතැයි සලකන තාක් කල් ඔබට මෙම සහාය ලැබෙනු ඇත.

ඔබට වෛද්‍යවරයා, හෙදිය සහ විශේෂිත කාර්ය මණ්ඩලය [*උදාහරණ ලෙස සමාජ සේවකයින්, මනෙෝ විද්‍යාඥයින් වැනි කාර්ය මණ්ඩලය* විශ්වාස කළ හැකි අතර ඔවුන් සමඟ නිදහසේ කතා කළ හැකිය. සියලුම තොරතුරු රහසිගතව තබා ගනු ඇත, එනම් ඔබේ එකඟතාවයකින් තොරව ඒවා අන් අය සමඟ බෙදා නොගනු ඇත.

එය එසේ නොවන්නේ ඔබේ හෙෝ වෙනත් කෙනෙකුගේ ජීවිතය අවදානමට ලක්ව ඇති අවස්ථාවක පමණි.

## දරුවන්ට අධ්‍යාපනයට ඇති අයිතිය

වයස අවුරුදු 18 ට අඩු සියලුම ළමුන්ට, පිරිමි ළමුන්ට සහ ගැහැණු ළමුන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත.

ඔවුන්ට භාෂා පන්ති වැනි සහාය ලැබෙනු ඇත.



**දෙමාපියන්ට තම දරුවන් පාසල් යැවීම සඳහා වගකීමක් ඇත.**

**ඉතාලියේදී, වයස අවුරුදු 6 සහ 16 අතර වයසේ පසුවන බාලවයස්කරුවන් පාසල් යා යුතුය.**

## රැකියාවක නිරත වීමට ඇති අයිතිය

ඔබේ තත්ත්වය අනුව,ඉතාලිය හි ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඔබේ අයදුම්පත ලියාපදිංචි කිරීමෙන් මාස 3 කට පසුව ඔබට රැකියාවක නිරත වීමේ අයිතිය ලැබිය හැකිය.

කාර්ය මණ්ඩලය ඉතාලිය හි අදාළ වන නීති පිළිබඳ ව ඔබට දැනුම් දෙනු ඇත.



ඇතැම් ව්‍යතිරේක ඇත, උදාහරණයක් ලෙස ඔබ බලධාරීන් සමඟ සහයෙෝගයෙන් කටයුතු නොකරන්නේ නම් ඔබට රැකියාවක නිරත වීමට අවසර නොලැබේ

*සහ අවශ්‍ය පරිදි වෙනස් කළ හැකි*] ඔබ රැකියාවක නිරත වන්නේ නම් සහ ඔබ පිළිගැනීමේ මධ්‍යස්ථානයක නැවතී සිටින්නේ නම් හෙෝ පුද්ගලික නවාතැන්පලක නැවතී සිටීමට මූල්‍ය දීමනාවක් ලබන්නේ නම්, ඔබට ඔබේ නවාතැන් සඳහා අර්ධ වශයෙන් ගෙවීමට සිදුවිය හැකිය.



16 ට අඩු සියලුම පිරිමි සහ ගැහැණු ළමයින්ට රැකියාවක නිරත් වීමට අවසර නැත.

## භාෂා පාඨමාලා සහ වෘත්තීය පුහුණුව

ඔබේ තත්ත්වය අනුව, බලධාරීන් ඔබෙන් පහත ඒවාට සහභාගී වන ලෙස ඉල්ලා සිටිය හැකිය:

- භාෂා පාඨමාලා,
- ඔබ ජීවත් වන සමාජය පිළිබඳ ව වන පාඨමාලා (නීති, රීති සහ සංස්කෘතිය)

ඔබට පහත ඒවාට සහභාගී විය හැකිය:

- නව කුසලතා ඉගෙනීම සඳහා වන පාඨමාලා (වෘත්තීය පුහුණුව).



මෙම පාඨමාලා පිළිබඳව සහ ඒවා ආරම්භ කළ හැක්කේ කවදාද යන්න පිළිබඳව කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත.

## ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු බව සඳහන් කරන ලේඛනය



දේශපාලන රැකවරණ අයදුම්පතක් සඳහා  ලෙස හැඳින්වෙන නිල ලේඛනයක් ඔබට ලැබෙනු ඇති අතර එහි ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු බව සඳහන් වේ. මෙම ලේඛනයේ ඔබේ නම සහ පුද්ගලික දත්ත සඳහන් වනු ඇත. ඔබ එය සැමවිටම ඔබ සමඟ රැගෙන යා යුතුය.

මෙය සංචාරක ලේඛනයක් නොවේ.

මෙම ලේඛනය නිකුත් කළ දිනය දක්වන අතර ඔබේ සරණාගත පිළිගැනීමේ ක්‍රියා පටිපාටිය නිශ්චිතවම අවසන් වන තෙක් එය අලුත් කළ හැකිය; ඔබේ සරණාගත අයදුම්පත පැහැදිලිවම පදනම් විරහිත නොවේ නම්, එය ඔබට ජාතික සෞඛ්‍ය සේවයේ ලියාපදිංචි වීමට සහ කම්කරු රෙගුලාසි වලට අනුකූලව වැඩ කිරීමට ඉඩ සලසයි.

**අවධානය පිණිසයි!** එය නැති කර නොගැනීමට සහ වෙන අයෙකුට එය ලබා නොදීමට වගබලා ගන්න.

## ඔබ නැවතී සිටින්නේ කොහේද?

බලධාරීන් ඔබ නැවතී සිටින ස්ථානය ඔබට පවසනු ඇති අතර කොන්දේසි පැහැදිලි කරනු ඇත.

ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබේ අයදුම්පත පරීක්ෂා කරන අතරතුර ඔබ නැවතී සිටින ස්ථානය බොහෙෝ සාධක මත රඳා පවතී.

**ඔබ කොතැනක නැවතී සිටියත්, ඔබට පහත අයිතීන් ඇත:**



- **සුරක්ෂිත වන්න:** කාර්ය මණ්ඩලය ඇතුළු කිසිවෙකුට ඔබට තර්ජනය කිරීමට, අපහාස කිරීමට හෝ හානි කිරීමට අවසර නැත



- **ඔබේ සැමියා, බිරිඳ, දරුවන් සහ වයස අවුරුදු 18 ට අඩු සහෝදර සහෝදරියන් සමඟ හෝ දෛනික රැකවරණය අවශ්‍ය වැඩිහිටි ඥාතියෙකු සමඟ නැවතී සිටින්න**
- ඔබ දෛනික රැකවරණය අවශ්‍ය වැඩිහිටියෙකු නම්**, ඔබේ ඥාතීන් සමඟ නැවතී සිටින්න.**



- ඔබේ පවුලේ අය සමඟ **සන්නිවේදනය කිරීමට** සහ **ඔවුන් සිටින ස්ථානය ඔබ නොදන්නේ නම්, ඔවුන් සොයා ගැනීමට** උපකාර ලබා ගන්න.

**ඔබ මෙසේ විශ්වාස කරන්නේ නම්, ඔබට විධිමත් පැමිණිල්ලක් කළ හැකිය:**



- කාර්ය මණ්ඩලයේ කිසිවෙකු ඔබට තර්ජනය, අපහාස හෝ හානි සිදු කර ඇත.

විධිමත් පැමිණිල්ලක් සිදු කරන ආකාරය බලධාරීන් ඔබට දන්වනු ඇත.

ඔබට සැමවිටම බලධාරීන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින් හෝ එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයෙන් (UNHCR) වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිය හැකිය.

**බලධාරීන් ඔබ කුමන නවාතැනේ නැවතී සිටින්නේ ද යන්න තීරණය කරයි. ඔබේ තත්ත්වය අනුව, ඔබට ඉතාලිය තුළ නිදහසේ ගමන් කිරීමට හැකි විය හැකිය.**



ඔබ නැවතී සිටින ස්ථානය රඳා පවතින්නේ ලබාගත හැකි ස්ථාන, ඔබේ තත්ත්වය සහ ඔබේ අවශ්‍යතා (උදාහරණයක් ලෙස, ඔබේ පවුලේ සංයුතිය, ඔබේ සෞඛ්‍යය) වැනි අංග මත ය.

ඔබට පවරා ඇති නවාතැනේ ඔබ නැවතී සිටින තාක් කල් පමණක් ඔබට සහාය සහ සේවාවන් ලැබෙනු ඇත. ඔබ මෙම නවාතැනේ නැවතී සිටිනවා ද යන්න බලධාරීන් විසින් පරීක්ෂා කරනු ඇත.

ඔබට ප්‍රමාණවත් මූල්‍ය සම්පත් තිබේ නම් සහ බලධාරීන් ඔබට නිශ්චිත නවාතැනක නැවතී සිටීමට සිදු නොවන බව තීරණය කරන්නේ නම්, ඔබට පුද්ගලික නවාතැනක නැවතී සිටීමට තෝරා ගත හැකිය. මෙම අවස්ථාවේ දී, ඔබට ඔබේ පවුලේ අය හෝ මිතුරන් සමඟ නැවතී සිටීමට ද අවසර දිය හැකිය.

ඔබ පෞද්ගලික නවාතැනක පදිංචි වීමට තෝරා ගත්තද, ඔබේ දේශපාලන රැකවරණ අයදුම්පත (asylum application) සැකසීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ට අවශ්‍ය විටෙක ඔබව සම්බන්ධ කරගත හැකි තත්ත්වයෙන් පසුවීම අනිවාර්ය වේ. නීති රෙගුලාසිවලට අනුකූලව සෞඛ්‍ය සේවා ලබා ගැනීමට සහ රැකියාවක නිරත වීමට ඔබට අයිතියක් ඇත; එසේම භාෂා, පුරවැසි අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීමටද ඔබට අයිතියක් ඇති අතර, ඒ පිළිබඳ තොරතුරු ඔබේ අයදුම්පත භාරව කටයුතු කරන ප්‍රාදේශීය පරිපාලන කාර්යාලයෙන් ඉල්ලා සිටිය හැක.



**ඔබ නිශ්චිත ස්ථානයක (උදාහරණයක් ලෙස නිශ්චිත පිළිගැනීමේ මධ්‍යස්ථානයක) නැවතී සිටිය යුතු බව තීරණය කළ හැකිය.**



**යම් යම් සීමාවන් සහිතව ඔබට එම නිශ්චිත ස්ථානයෙන් පිටතට යාමට අවසර දෙනු ලැබේ. එම නිශ්චිත ස්ථානයේ ඔබේ පැමිණීම නිතිපතා පරීක්ෂා කළ හැකිය.**

බලධාරීන් හේතු කිහිපයක් නිසා මෙය තීරණය කළ හැකිය. උදාහරණයක් ලෙස:

- ඔබ පලා යා හැකි අවදානමක් ඇත.
- ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වෙනත් රටක් වගකිව යුතු අතර බලධාරීන් ඔබ පලා යා හැකි බව සිතයි
- ඔබ අවසරයකින් තොරව මේ රට හැර ගොස් ඇත, ඔබව ආපසු එවා ඇත, එමෙන්ම ඔබ නැවත පලා යාමේ අවදානමක් ඇත.

**බලධාරීන් මෙම තීරණය ඔබට වැටහෙන භාෂාවකින් ලිඛිතව දැනුම් දෙනු ඇත. ඔබ තීරණයට ගරු නොකරන්නේ නම් ඔබේ අයිතීන්, වගකීම් සහ ඍණාත්මක ප්‍රතිවිපාක පිළිබඳ ව ඔවුන් ඔබට දැනුම් දෙනු ඇත.**

ඔබට මෙම තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

ඔබට සීමිත කාලයක් සඳහා වෙනත් ස්ථානයක නැවතී සිටිය හැකිදැයි ඔබට බලධාරීන්ගෙන් විමසිය හැකිය. බලධාරීන්ට ඔබේ ඉල්ලීම අනුමත කළ හෙ ෝ නොකළ හැකිය. ඔබේ ඉල්ලීම ප්‍රතික්ෂේප වුවහොත්, ඔබට මෙම තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

**අවධානය පිණිසයි!** මෙම නිශ්චිත ස්ථානයේ නැවතී සිටීමට ගත් තීරණයට සහ පනවා ඇති සීමාවන්ට ඔබ ගරු නොකරන්නේ නම් සහ ඔබ නැවත පලා යාමේ අවදානමක් තිබේ නම්, ඔබව රඳවා තබා ගත හැකිය.

## අයදුම්කරුවෙකු රඳවා තබා ගත හැකි අවස්ථා

රඳවා තබා ගැනීම යන්නෙන් අදහස් වන්නේ ඔබට නිදහසේ පිටව යා නොහැකි නිශ්චිත පහසු ස්ථානයක ඔබව තබා ඇති බවයි. ඔබව රඳවා තබා ගැනීමට බලධාරීන්ට වලංගු හේතුවක් තිබිය යුතුය. ඔබේ තත්ත්වයේ දී වෙනත් විකල්පයක් කළ නොහැකි බවට ඔවුන් සහතික විය යුතුය. බලධාරීන් තීරණය කිරීමට පෙර ඔබේ පුද්ගලික තත්ත්වය පිළිබඳව සලකා බලනු ඇත.



රඳවා තබා ගැනීමට හේතු විය හැක්කේ, උදාහරණයක් ලෙස:

- රඳවා තබා ගැනීමකින් තොරව ඔබේ රැකවරණ අයදුම්පතෙහි වැදගත් අංග (උදාහරණයක් ලෙස ඔබේ අනන්‍යතාවය) සත්‍යාපනය කළ නොහැකිය
- ඔබ නිශ්චිත ස්ථානයක නැවතී සිටීමේ වගකීමට ගරු නොකළ අතර, ඔබ නැවත පලා යාමේ අවදානමක් ඇත, එමෙන්ම බලධාරීන්ට ඔබ වෙත ළඟා විය නොහැකිය
- ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීමට වගකිව යුතු EU + රටට මාරු කිරීමට ඔබට තීරණයක් ලැබී ඇති අතර මාරුවීමට පෙර ඔබ පලා යාමේ අවදානමක් ඇත
- ඔබ ආරක්ෂක අවදානමක් ඇති බව පෙන්වයි.

ඔබව රඳවා තබාගෙන සිටී නම්, ඔබට තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. ඔබට නොමිලේ නීති සහාය සහ නියෙෝජනය ඉල්ලා සිටිය හැකිය.

## ඔබට පිළිගැනීම තුළ ඇති වගකීම් මොනවාද?





**ඔබ ඉටු කළ යුතු වගකීම් කිහිපයක් පහතින් දැක්වේ.**

- ✔ මේ රටේ නීති පිළිපදින්න.
- ✔ ඉතාලියතුළ නැවතී සිටින්න සහ බලධාරීන්ගේ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් නොකරන්න.
- ✖ අවසරයකින් තොරව භූගෝලීය ප්‍රදේශයෙන් පිටව නොයන්න හෝ බලධාරීන් ඔබ නැවතී සිටිය යුතු බව පැවසූ නිශ්චිත ස්ථානයෙන් පිටව නොයන්න
- ✔ බලධාරීන් සමඟ සම්පූර්ණයෙන්ම සහයෝගයෙන් කටයුතු කරන්න සහ ඔවුන්ගේ උපදෙස් අනුගමනය කරන්න.
- ✔ ඔබ නැවතී සිටින ස්ථානයේ නීතිරීතිවලට ගරු කරන්න.
- ✔ අනෙකුත් පදිංචිකරුවන්ට, කාර්ය මණ්ඩලයට සහ අනෙකුත් පුද්ගලයින්ට ගරු කරන්න.
- ✔ ඔබේ මූල්‍ය සම්පත් පිළිබඳව බලධාරීන්ට [*බලධාරීන්ගේ නම*] දැනුම් දෙන්න.
- ✔ ඔබේ වත්මන් ලිපිනය සහ සම්බන්ධතා තොරතුරු (දුරකථන අංකය, ඊමේලය) සහ ඕනෑම වෙනස්කමක් පිළිබඳව බලධාරීන්ට දැනුම් දෙන්න, එවිට ඔවුන්ට සැමවිටම ඔබව සම්බන්ධ කර ගත හැකිය.
- ✔ බලධාරීන් විසින් තීරණය කරනු ලබන සංකලනය සඳහා අනිවාර්ය පාඨමාලාවලට සහභාගී වන්න.

## ඔබ ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද?

බලධාරීන් ඔබේ තත්වය ඇගයීමට ලක් කරනු ඇති අතර යම් ආකාරයේ සහායන් පහත හෙළීමට හෙෝ අවලංගු කිරීමට තීරණය කළ හැකිය. බලධාරීන් එවැනි තීරණයක් පිළිබඳ ව ලිඛිතව ඔබට දන්වනු ඇති අතර ඔවුන් පහත හෙළන්නේ හෙෝ අවලංගු කරන්නේ කුමන සහායද යන්න සඳහන් කරනු ඇත.



### අවධානය පිණිසයි!

**ඔබට අඩු සහායක් ලැබිය හැකිය,** උදාහරණයක් ලෙස:


- ඔබ අවසරයකින් තොරව භූගෙෝලීය ප්‍රදේශයෙන් හෙෝ බලධාරීන් ඔබ නැවතී සිටිය යුතු බව පැවසූ නිශ්චිත ස්ථානයෙන් පිටව යන්නේ නම්
- ඔබ බලධාරීන් සමඟ සහයෙෝගයෙන් කටයුතු නොකරන්නේ නම්
- ඔබ ඔබේ මූල්‍ය සම්පත් පිළිබඳ ව සත්‍ය නොපවසන්නේ නම්

- ඔබ නැවතී සිටින ස්ථානයේ නීති කඩ කරන්නේ නම්
- ඔබ අනිවාර්ය පාඨමාලා සඳහා සහභාගී නොවන්නේ නම්
- ඔබ දැනටමත් වෙනත් EU+ රටක රැකවරණය සඳහා ඉල්ලුම් කර ඇති අතර ඔබ එම රටින් පිටව ගොස් තිබේ නම්.
- ඔබ මීට පෙර අවසාන ප්‍රතික්ෂේප කිරීමක් ලබා ගැනීමෙන් පසු නව රැකවරණ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, එය පිළිගත නොහැකි බව ප්‍රකාශ කර ඇත

ඔබ ප්‍රචණ්ඩකාරී නම්, අන් අයට තර්ජනය කරන්නේ නම් හෙෝ ඔබ නැවතී සිටින ස්ථානයේ නීති නැවත නැවතත් හෙෝ බරපතල ලෙස කඩ කරන්නේ නම් **ඔබට ලැබෙන සහාය අහිමි විය හැකිය**. මෙම අවස්ථාවේ දී, මැදිහත් වීමට පොලිසිය ද කැඳවිය හැකිය.



## බලධාරීන්ගේ අවසරයකින් තොරව ඔබ වෙනත් EU+ රටකට ගමන් කළහොත් කුමක් සිදුවේද?




**ඉතාලිය හි:**

- ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නතර විය හැකිය.

**ඔබ අවසරයකින් තොරව ගමන් කළ EU+ රටෙහි:**

- ඔබ අවසරයකින් තොරව හැර ගිය රටට ඔබව ආපසු යැවීමට බලධාරීන් තීරණය කළ හැකිය.

බලධාරීන් ඔබව ආපසු යැවීමේ තීරණය පිළිබඳව ඔබට දැනුම් දුන් මොහොතේ සිට, ඔබට ඇතැම් අයිතීන් සඳහා ප්‍රවේශය නොලැබෙනු ඇත, උදාහරණයක් ලෙස:

- ඔබට **බොහෙෝ සේවාවන් සහ ඇතැම් ආකාරයේ සහායන්** නොලැබෙනු ඇත
- ඔබට **රැකියාවක නිරත වීමට** අවසර නොලැබෙනු ඇත
- ඔබට **භාෂා පාඨමාලා හෙෝ නව කුසලතා ඉගෙන ගැනීමේ පාඨමාලා සඳහා සහභාගී වීමට අවසර නොලැබෙනු ඇත**

## ඔබ අවසරයකින් තොරව හැර ගිය EU+ රට වෙත ආපසු යැවූ පසු කුමක් සිදුවේද?



බලධාරීන් ඔබට නිශ්චිත ස්ථානයක නැවතී සිටිය යුතු බව තීරණය කළ හැකි අතර ඔබේ පැමිණීම නිතිපතා පරීක්ෂා කරනු ඇත. යම් යම් සීමාවන්ට යටත්ව ඔබට මධ්‍යස්ථානයෙන් පිටතට යාමට හැකි වනු ඇත.

## ඔබට අධිකාරියේ තීරණයකට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය



අයදුම්කරුවෙකු ලෙස ඔබේ අයිතීන් සීමා කිරීමට බලධාරීන් [*අධිකාරියේ නම*] තීරණය කරන්නේ නම් සහ එය අසාධාරණ යැයි ඔබ විශ්වාස කරන්නේ නම්, **ඔබට එම තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.**

බලධාරීන් පහත දේ තීරණය කරන්නේ නම් ඔබට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය:

- ඔබට නවාතැන් සහ අනෙකුත් පිළිගැනීමේ සහාය සඳහා අයිතියක් නොමැත
- ඔබට ලබා දෙන පිළිගැනීමේ සහාය පහත හෙළීමට හෙෝ අවලංගු කිරීමට
- තාවකාලිකව නිශ්චිත භූගෙෝලීය ප්‍රදේශයකින් හෙෝ නිශ්චිත ස්ථානයකින් ඉවත් වීමට වන ඔබේ ඉල්ලීම අනුමත නොකිරීමට
- ඔබ නිශ්චිත ස්ථානයක (උදාහරණයක් ලෙස නිශ්චිත පිළිගැනීමේ මධ්‍යස්ථානයක) නැවතී සිටීමට බැඳී සිටින අතර ඔබට යම් සීමාවන් සමඟ පිටතට යා හැකිය

පොලිසිය විසින් පහත සඳහන් තීරණය ගනු ලැබුවහොත් ඔබට විනිසුරුවරයා ඉදිරියේ අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය:

- ඔබව රඳවා තබා ගැනීමට

ඔබ බලධාරීන්ගේ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් කර එහි යම් පිළිගැනීමේ අයිතීන් ඔබට අහිමි වුවහොත්, ඔබට මෙම තීරණයට එම රට තුළ අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

22න පිටුවේ පැහැදිළි කර ඇති තත්ත්වයන් හේතුවෙන් ඉතාලිය හි බලධාරීන් ඔබට ලබා දෙන පිළිගැනීමේ සහාය පහත හෙළීමට හෙෝ අවලංගු කිරීමට තීරණය කරන්නේ නම්, ඔබට තවමත් යම් අයිතීන් ඇත. උදාහරණයක් ලෙස, ඔබට වෛද්‍යවරයෙකු හෙෝ හෙදියක හමුවීමට, වෛද්‍ය ආධාර ලබා ගැනීමට, යම් සහායක් ලබා ගැනීමට සහ බලධාරීන් විසින් තීරණය කරන ලද පරිදි ඔබට නිදා ගැනීමට ස්ථානයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

ඔබට ලැබෙන සහායේ ආකාරය ඔබේ පුද්ගලික තත්ත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

ඔබ අවසරයකින් තොරව ගමන් කළ වෙනත් EU+ රටක බලධාරීන් ඔබට ලබා දී ඇති පිළිගැනීමේ සහාය අවලංගු කිරීමට තීරණය කළ විට, ඔබට තවමත් ලැබෙන සහායේ ආකාරය ඔබේ පුද්ගලික තත්ත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

## ඔබට නීතිමය සහාය ලැබිය හැකිය



ඔබේ පිළිගැනීමේ අයිතිවාසිකම් විනිසුරුවරයෙකු ඉදිරියේ සීමා කිරීමට බලධාරීන් ගත් තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔබට අවශ්‍ය නම්, ඔබේ තත්වය අනුව ඔබට නොමිලේ නීති සහාය සහ නියෙෝජනය ලැබෙනු ඇත.

මෙයින් අදහස් වන්නේ නීති උපදේශකයෙකු හෙෝ නීතිඥයෙකු ඔබට උපකාර කරනු ඇති බවයි. නීති උපදේශකයින් හෙෝ නීතිඥයින් ,විනිසුරුවරයෙකු ඉදිරියේ ඔබට නීතිමය සහාය ලබා දෙයි, ඔබේ අභිරුචිය ආරක්ෂා කරයි සහ ඔවුන් බලධාරීන්ගෙන් සහ විනිසුරුවරයාගෙන් ස්වාධීන වේ.

ඔබට ඔබේම වියදමින් නීති උපදේශකයෙකුගෙන් හෙෝ නීතිඥයෙකුගෙන් උපදෙස් ලබා ගත හැකිය.




තීරණයකට අභියාචනා කරන ආකාරය බලධාරීන් ඔබට දන්වනු ඇත.

ගාස්තුවකින් තොර නීති ආධාර සහ නියෙෝජනය ඇතුළුව වැඩිදුර තොරතුරු ඔබට සැමවිටම බලධාරීන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින් හෙෝ UNHCR වෙතින් ඉල්ලා සිටිය හැක.

# මගේ සටහන්

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025